
# කිරි නිෂ්පාදනයේ දියුණුවට මග පෑදේ

මැදරට තෙත් කලාපයේ හෝ 70'' කටවැඩි වර්ෂාපතනයක් ලැබෙන පොල් වගා කර ඇති ප්‍රදේශයේ කිරි පට්ටිකරුවන්ට හා කිරිපට්ටි ආරම්භ කිරීමට බලාපොරොත්තු වන්නන්ට පහසු ගෙවීමේ ක්‍රමයකට ණය ලබා ගැනීමේ සැලැස්මක් දැන් ක්‍රියාත්මක කර ඇත.



**ණය මුදල් දෙනු ලබන්නේ:**

1. දැනට ඇති කිරි පට්ටි දියුණු කිරීමට;
2. අළුත් කිරි පට්ටි ආරම්භ කිරීමට;
3. තණකොල වගා කිරීමට;
4. ගව මඩු සෑදීමට;
5. ජල පහසුකම් ලබා ගැනීමට;
6. කිරි දෙනුන් මිලදී ගැනීමට;

**ණය ලැබීමට සුදුසුකම්:**

1. මැදරට තෙත් කලාපයේ හෝ 70''කට වැඩි වර්ෂාපතනයක් ඇති පොල් වගා කර ඇති ප්‍රදේශයේ පදිංචිකරුවෙක්වීම:
2. තණකොල වැවීමට සුදුසු, අඩුවශයෙන් අක්කරයක බිමක් තිබීම;
3. බැංකු ණය කොන්දේසි සපුරාලීමට සමත් වීම;
4. කිරි නිෂ්පාදනය සඳහා උනන්දුවක් දක්වීම.

**ණය කොන්දේසි:**

1. සියයට 10 ක වාර්ෂික පොලියක් අය කරනු ඇත;
2. අවුරුදු 12 ක් ඇතුළත ණය මුදල ආපසු ගෙවිය යුතුය.

**ණය ලබා ගැනීමට කටයුතු කිරීම:**

1. ඔබේ ප්‍රදේශයේ ලංකා බැංකු ශාඛාවෙන් මහජන බැංකු ශාඛාවෙන් හෝ සමුපකාර ග්‍රාමීය බැංකුවෙන් අයදුම් පත් ලබා ගත හැකිය.
2. එහිදී ඔබට ආකෘතිපත් දෙවර්ගයකින් දෙකක් ලැබෙනවා ඇත.
3. බැංකු පෝර්මය සම්පූර්ණ කර ආපසු බැංකුවට, බාර දෙන්න.
4. කාර්මික පෝර්මය සම්පූර්ණ කර ඔබේ ප්‍රදේශයේ සත්ව පාලන නිළධාරිට භාර දෙන්න.

**ණය මුදල් අනුමත කිරීම:**

1. ණය මුදල් ලැබීමට ඔබට ඇති යෝග්‍යතාවය බැංකුව විසින් තීරණය කරනවා ඇත.
2. කිරිපට්ටිය පිළිබඳ කාර්මික හා ආර්ථික යෝග්‍යතාවය පේරාදෙනියේ කිරිපට්ටි සංවර්ධන ව්‍යාපාරයේ ප්‍රධාන කාර්යාලය විසින් තීරණය කරනවා ඇත.
3. ඉහත කී අවශ්‍යතා සපුරාලන අයට ණය දීම අනුමත කරනවා ඇත.
4. ණය මුදල් කොටස් වශයෙන් ගෙවනු ලැබේ.

**ඔබේ ගොවිපල සැළසුම් කිරීම:**

1. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවිපල් සැළසුම් ශිල්පිවරුන් ඔබ හමු වී අවශ්‍යතා අනුව ගොවිපල සැළැස්මක් සකස් කරනවා ඇත.
2. මෙම ගොවිපල් සැළැස්මට, මුදල ආයෝජනය, විකිණීම හා පවත්වා ගෙන යෑමේ වියදම් සහ ආදායම් හා වියදම් පිළිබඳ විස්තර ද ඇතුළත් වේ.

තණකොල දඬු ලබා ගැනීම:

1. සිටවීමට ඔබට අවශ්‍ය තණකොළ දඬු කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මේ ව්‍යාපාරයෙන් මිළදී ගත හැක.
2. විශාල තොග සඳහා ප්‍රවාහන පහසුකම් ලබාදිය හැකිය.
3. විශාල වශයෙන් වැවීමට ඔබේම තවානක් සකස්කර ගැනීම වඩාත් සුදුසුයි.

දෙනුන් මිළදී ගැනීම:

1. ආනයනය කරන සතුන් ලබා ගත හැකිය නමුත් උන්ගේ මිළ අධික නම්, අනෙක් පට්ටි හිමියන්ගෙන් සතුන් මිළදී ගැනීමට ඉඩ ඇත.
2. සතුන්ගේ වටිනාකම බැංකුව විසින් කෙළින්ම සතුන් හිමියාට ගෙවනු ලැබේ.
3. දෙනුන් තේරීමේ දී හා වටිනාකම තක්සේරු කිරීමේදී ගොවිපල් සැළසුම් ශිල්පීන්ගේ සහාය ඔබට ලබාගත හැකිය.
4. මෙම වර්ෂයේදී මේ ව්‍යාපාරය යටතේ දෙනුන් හා වැස්සියන් විකිණීමට කෘෂි කර්ම දෙපාර්තමේන්තුව ආරම්භ කර ඇත.

ඔබේ ගොවිපල සංවර්ධනය හා පවත්වාගෙන යෑම:

1. ගොවිපල් සැළසුම් ශිල්පීන් ගොවිපලට නිතරම පැමිණෙනු ඇත.
2 ඔහුගේ උපදෙස් පිළිපැදීමට ඔබ බැඳී ඇත.
3. ගොවිපලේ ප්‍රගති වාර්තා මේ ශිල්පීන් විසින් නඩත්තු කරනු ඇත.
4. ප්‍රගතිය අසතුටුදායක නම්, ණය මුදල් අත්හිටුවීමට සිදු වනු ඇත.

කිරි අලෙවිය:

1. ඔබ ගොවිපලේ නිපදවන කිරි සමුප කාර සමිතියට හෝ කෙළින්ම කිරි මණ්ඩලයට අලෙවි කළ යුතුය.
2. සතුටුදායක මිළක් ලබා දීමට ව්‍යාපාරය සහාය වනවා ඇත.
3. සියයට 4.5 ක මේදය සහිත කිරි පයින්ට් එකකට ශත 95 ක් කිරි මණ්ඩලය විසින් ගෙවනු ලැබේ.

මේ ව්‍යාපාරයෙන් ඔබත් ප්‍රයෝජනය ගන්න!